**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ "සුපිළිපන්න ද්වාරය" සය මාසික විද්‍යුත් සඟරාව සඳහා ලිපි හා නිර්මාණ ලබාගැනීම.**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ අංශයේ මෙහෙයවීමෙන් 2022.12.09 වන දින එළිදැක්වීමට යෙදුණු සය මාසික විද්‍යුත් සඟරාවේ දෙවන කලාපය සඳහා නිර්මාණශීලී ලේඛනයෙහි දක්ෂ ඔබට ලිපි හා නිර්මාණයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත.

ඔබ සැමට සුහද ආරාධනා...............

සුදුසු ලිපි හා නිර්මාණයන් 2023.04.17 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබීමට කටයුතු සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමු.

ලිපි සහ නිර්මාණයන් යොමු කරන විට පහත නිර්ණායකයන් අනුගමනය කරන මෙන් ඉල්ලා සිටිමු.

I. ඔබගේ ලිපි හා නිර්මාණයන්, අල්ලස දූෂණය තුරන් කිරීම සහ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීමෙහි විෂය පථය අරමුණු කරගත් නිර්මාණශීලී, අර්ථාන්විතබාවයෙන් සමන්විත විය යුතුය.
II. වචන 500 – 750 ත් අතර විය යුතුය.
III. ඔබ විසින් අපට ලබාදෙන ලිපිය ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර එය ඔබ විසින් ඔබගේ අත්සන සහිතව සහතික කළ යුතුය.
IV. ඔබ යම් උපුටා ගැනීමක් හෝ දත්ත නිරූපණයක් කරන්නේ නම් එහි කතෘ අයිතිය සුරැකෙන පරිදි ඉදිරිපත් කළ යුතු අතර මූලාශ්‍රයන් ද සඳහන් කළ යුතුය.
V. ලිපි ලිවිය යුතු Font size – 12.5, ලිපි ලිවිය යුතු Font – FMAbhaya
VI. මාධ්‍ය - සිංහල හෝ ඉංග්‍රීසි
VII. අල්ලස හා දූෂණය තුරන් කිරීමෙහි විෂය පථය අරමුණු කරගත් කාටූන් ද අප වෙත යොමු කිරීමට අවස්ථාව ඇත.
VIII. ඔබගේ ලිපියෙහි හෝ නිර්මාණයන්හි , ඔබගේ නම සහ අත්සන, දුරකථන අංකය සඳහන් කර ස්කෑන් කරන ලද PDF File එක සහ එහි MS Word Document එක අපගේ prevention_unit@ciaboc.gov.lk යන විද්‍යුත් ලිපිනයට 2023.04.17 වන දින හෝ ඊට පෙර ලැබීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මේ සම්බන්ධයෙන් ඔබට වැඩිමනත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011- 2588368 ඔස්සේ දූෂණ නිවාරණ අංශයේ රුශාන්ති දිල්ශානි මෙනවිය සහ සම්පත් ආරච්චිගේ මහතාව සම්බන්ධ කරගන්නා මෙන් වැඩිදුරටත් දන්වා සිටිමු.මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමු.

දූෂණ නිවාරණ අංශය,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.